## පළමුවන දේව ප්‍රකාශනය

ක්‍රියා 3:13-15,17-20

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.

**(ඔබ ජීවනයේ ස්වාමියාණන් මරණයට පත්කළහුය. එහෙත් දෙවියන් වහන්සේ එතුමන් මරණයෙන් උත්ථාන කළ සේක.)**

ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද දෙවි වූ අපගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ තමන් සේවකයා වූ ජේසුස් වහන්සේ මහිමයට පැමිණ වූ සේක. එහෙත්, ඔබ උන්වහන්සේ නඩු ශාලාවට පැමිණෙව්ව හුය. තවද පිලාත් උන්වහන්සේ නිදහස් කරන්නට තීරණය කරගෙන සිටි විට ඔහු ඉදිරියේ ම ඔබ උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහුය. ඔබ සුවිශුද්ධ වූ ධර්මිෂ්ඨ වූ තැනන්වහන්සේ ප්‍රතික්ෂේප කර ඒ වෙනුවට මිනීමරුවකු මුදාදෙන මෙන් ඉල්ලා සිටියහු ය. මෙසේ ඔබ ජීවනේශ්වරයාණන් මරණයට පත්කළාහුය. එහෙත් දෙවියන් වහන්සේ උන්වහන්සේ මරණයෙන් උත්ථාන කර වදාළ සේක. අපි ඊට සාක්ෂිකාරයෝ වම්හ. "දැන් ඉතින් සහෝදරවරුනී, ඔබගේ ප්‍රධානීන් මෙන්ම ඔබද, නොදැනුම් කමින් ක්‍රියා කළ බව මම දනිමි. එසේ වුවත්, ස්වකීය ක්‍රිස්තුස් වහන්සේ දුක්විඳිය යුතු යයි දෙවියන් වහන්සේ සියලු දිවැසිවරයන්ගේ මුවින් පෙර දන්වා වදාළ දේ, මෙසේ සම්පූර්ණ කළ සේක. එබැවින්, ඔබේ පව් මකාලන පිණිස ද දෙවියන් වහන්සේ කෙරෙන් නව ජීවන යුගයක් පැමිණෙන පිණිස ද ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුස් නම් ජේසුස් වහන්සේ එවා වදාරණ පිණිස ද පසුතැවී සිත් හරවා ගෙන දෙවියන් වහන්සේ වෙතට හැරෙන්න.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 4:1,3,6,8

පිළිතුර: සමිඳුනි, අප වෙත ඔබ කරුණා නෙත් යොමුකළ මැනව.
**ආලේලූයා! ආලේලූයා!**

ගීය: මා රක්නා මාගේ දෙවිඳුනි, මේ යාදින්නට පිළිතුරු දුන මැනව, විපතේ දී ඔබ මා මිදූ සේක. මට කරුණාකර මේ යැදුමට සවන් දුන මැනව.

සමිඳාණන් දැහැමි අය තමන්ට ම තෝරා ගත් බව සිතට ගන්න. එතුමාණෝ මාගේ යැදුමට සවන් දෙන සේක. යළි අපට ප්‍රීතිය පෙන්වන්නේ කවරෙක් ද"යි බොහෝ දෙන කියති.

සමිඳුනි, අප වෙත ඔබ කුළුනැස යොමුකළ මැනව. මම ශාන්ත සිතින් සැතපී, වහා නින්දට යමි. මන්ද, සමිඳුනි, ඔබ මට සුරැකිව විසීමට වර දෙන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

1 ජොහන් 2:1-5

ජොහන් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**(අපේ පව් උදෙසා ද සකල ලෝකයේ පව් උදෙසා ද ශාන්තිකර යාගය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.)**

මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා මා ඔබට ලියා එවන්නේ, ඔබ පව් නොකරන පිණිස ය. එහෙත් යමෙකු පව් කළොත්, ධර්මිෂ්ඨ වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නම් මැදහත්කාරයාණන් කෙනෙක් අප වෙනුවෙන් පියාණන් වහන්සේ වෙත සිටින සේක. අපේ පාපයෙන් මිදීමේ මිලය උන් වහන්සේ ය; එය අපේ පව් උදෙසා පමණක් නොව සකල ලෝකයාගේ ද පව් උදෙසා ය. අපි උන් වහන්සේගේ ආඥා පිළිපදිමු

නම්, එයින් අප උන් වහන්සේ දන්නා බව සහතික වේ. "මම උන් වහන්සේ දනිමි"යි කියමින් උන් වහන්සේගේ ආඥා නොපිළිපදින තැනැත්තා බොරුකාරයෙකි; සත්‍යය ඔහු තුළ නැත. එහෙත් යමෙක් උන් වහන්සේගේ දහම පිළිපදින්නේ ද, ඒකාන්තයෙන් ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත. අප උන් වහන්සේ තුළ සිටින බව දනගන්නේ මෙසේ ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 24:32

ආලේලූයා! ආලේලූයා!
"උන් වහන්සේ අප හා සමග මග දී කතා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත්, අපේ හදවත දැවී ඇවිළී ගියා නොවේ ද"යි ඔව්හු එකිනෙකාට කී හ.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 24:35-48

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මරණින් නැගිටින්නටත් යුතු යයි ලියා ඇත්තේය.")**

එවිට ඔව්හු ද මග දී තමන්ට සිදු වූ කාරණා සහ රොටි කැඩීමෙහි දී ඔවුන්ට උන් වහන්සේ ප්‍රකාශ වූ හැටි ද පැවසූ හ. ශ්‍රාවකයන් මෙසේ කතා කරමින් සිටිය දී උන් වහන්සේ ඔවුන් මැදට වැඩම කර, "ඔබට ශාන්තිය වේ වා!"යි වදාළ සේක. එහෙත් ඔව්හු ත්‍රස්ත ව භීතියට පත් ව, ඒ අවතාරයකැ යි සිතූ හ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "ඔබ කැළඹී සිටින්නේ මන් ද? ඔබගේ සිත්වල සැක උපදින්නේත් මන් ද? මාගේ අත් හා පා බලන්න; මේ මා ම බව තේරුම්ගන්න; මා ස්පර්ශ කොට, බලන්න; ඔබට පෙනෙන ලෙස ඇට මස් සහිත සිරුරක් මට ඇත. අවතාරයකට නම් ඒවා නැතැ"යි වදාළ සේක. උන් වහන්සේ මෙවදන් කියා, තම අත් හා පා ඔවුන්ට පෙන්වූ සේක. ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස නොකොට පුදුම වෙමින් සිටිය දී, උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "කෑමට යමක් මෙහි ඔබ වෙත තිබේ ද"යි ඇසූ සේක. ඔව්හු බැදපු මාළු කැල්ලක් උන් වහන්සේට පිළිගැන්වූ හ. උන් වහන්සේ එය පිළිගෙන ඔවුන් ඉදිරිපිට දී වැළඳූ සේක. තවද උන් වහන්සේ කතා කරමින්, "මා පිළිබඳ මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද ගීතාවලියෙහි ද ලියා ඇති හැම දෙය ම ඉෂ්ට විය යුතු යයි මා ඔබ සමග සිටිය දී ඔබට පැවසූ වචනයෙහි තේරුම මේ ය"යි වදාළ සේක. එවිට උන් වහන්සේ ශුද්ධ ලියවිල්ල ඔවුන්ට වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා කතා කොට, "මෙසේ ක්‍රිස්තුන් වහන්සේ වද විඳින්ටත් තුන් වන දා මළවුන්ගෙන් නැගිටින්ටත්, ජෙරුසලමෙන් පටන්ගෙන සකල ලෝකවාසීන්ට පසුතැවී සිත් හරවා ගැනීම ද පව් කමාව ද, උන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත. ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහු ය. බලන්න, මම මාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව ඔබ වෙත ගෙනෙමි. එහෙත්, ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී සිටින්නැ"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.